සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சபரகமுவ மாகாணக் கல்வி திணைக்களம்

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2024

## අවසාන වාර පරීක්ෂණය

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
தோடர்பாடல் மற்றும் ஊடகக்கல்வி
Communication & Media Studies I

29 | S | I

13 ශ්‍රේණිය
தரம் 13
Grade 13

කාලය - පැය දෙකයි
02 மணித்தியாலம்
Time - Two Hours

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

01. සාර සන්නිවේදන කාර්යයක් සඳහා වඩාත් වැදගත් සන්නිවේදන මූලිකාංගය වන්නේ?
    1. සන්නිවේදකයා
    2. ප්‍රතිපෝෂණය
    3. මූලාශ්‍රය
    4. බාධක
    5. ග්‍රාහකයා

02. මහනුවර නගර මධ්‍යයේ දී සිදු වූ හදිසි අනතුරක් එදින රූපවාහිනියේ ප්‍රවෘත්ති විකාශනයේ දී රූප රාමු සහිත ව විකාශය විය. මෙය වඩාත් හොඳින් පැහැදිලි කළ හැකි සන්නිවේදන නිර්වචනය වන්නේ,
    1. හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ නිර්වචනය
    2. විල්බර් ශ්‍රාම්ගේ නිර්වචනය
    3. චාල්ස් එච්. කූලිගේ නිර්වචනය
    4. ෂැනොන්-වීවර් නිර්වචනය
    5. ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයේ නිර්වචනය

03. 1982 වර්ෂයේදී ගෲන්වල්ට් ප්‍රකාශනයෙන් අවධාරණය නොකළ කරුණ වන්නේ,
    1. මාධ්‍යයේ අහිතකර බලපෑමෙන් ළමා හා තරුණ පරපුර මුදවා ගත යුතු බව
    2. මාධ්‍ය සාක්ෂරතාව හා විචාරශීලී චින්තනය ගොඩ නැඟීම.
    3. මාධ්‍ය සංදේශවලින් ලබාදෙන විනෝදාශ්වාදය ගැන පමණක් අවධානය යොමු කළ යුතු බව
    4. නිර්මාණශීලී චින්තනයෙන් දරුවන් බලසම්පන්න කළ යුතු බව
    5. පෙර පාසල් අවධියේ සිට ම මාධ්‍ය අධ්‍යාපනය ලබා දිය යුතු බව

04. පසුගිය දින කීහිපයේ දී ජනමාධ්‍ය මඟින් ජනාධිපති අපේක්ෂකයන් පිළිබඳ තොරතුරු වඩාත් අවධාරණයෙන් විස්තර කෙරිණි. මෙම තත්ත්වය පැහැදිලි කළ හැකි HUB ආකෘතියේ මූලිකාංගය වන්නේ,
    1. මාධ්‍ය විස්තාරණය
    2. මාධ්‍ය විකෘතිය
    3. සංදේශය
    4. ප්‍රතිපෝෂණය
    5. බලපෑම

05. ශ්‍රවණාගාරය තුළ සිදු කළ දේශනය, ශ්‍රවණාගාරයෙන් පිටත සිටි නිමල්ට නිසි ආකාර ව ශ්‍රවණය නොවූයේ ඔහු සංදේශය ලබා ගත හැකි සීමාවක නොසිටි නිසා ය. මෙවැනි අවස්ථාවකට අදාළ සන්නිවේදන වර්ගය වන්නේ,
    1. වාචික සන්නිවේදනය
    2. ජන සන්නිවේදනය
    3. කථන සන්නිවේදනය
    4. මහජන සන්නිවේදනය
    5. අකථ්‍ය සන්නිවේදනය

06. A - ඕෂධ විසින් රාමායණයේ හනුමාගේ චරිතය වේදිකාව මත රඟ දැක්වීම.

B - Zoom තාක්ෂණයෙන් පැවැත්වෙන කාර්ය මණ්ඩල සාකච්ඡාවක්

C - මැතිවරණය ඉලක්ක කරගත් දේශපාලන රැස්වීමක්

D - සුබ සාධක සමිතියේ අයවැය වාර්තාව මුද්‍රණය කර බෙදා හැරීම.

E - දේශපාලනඥයෙකුගේ පෞද්ගලිකත්වය පිළිබඳ අසත්‍ය තොරතුරු ප්‍රචාරය කිරීම.

මෙම අවස්ථා අතුරින් සන්නිවේදන ස්වරූප පමණක් ඇතුළත් වරණය වන්නේ,

1. ABC 2. ADE 3. ACD 4. CDE 5. ACE

07. ආපදා කළමනාකරණ අවස්ථාවලදී සහ ක්ෂණික ව වෙනස් වන තත්ත්වවලදී ආයතනයට අනුබද්ධ පාර්ශව වෙත සන්නිවේදනය කිරීම සඳහා භාවිත කරන මහජන සම්බන්ධතා මෙවලම් හා විධික්‍රම පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. ප්‍රදර්ශන පැවැත්වීම, ලිපි යැවීම, විදෙස් සංචාර සිදු කිරීම.
2. පුවත් හසුන, රැස්වීම් පැවැත්වීම, පරිත්‍යාග සිදු කිරීම
3. වීඩියෝ ප්‍රවෘත්ති, අනුග්‍රාහකත්වය, ලිපි යැවීම
4. පුවත් නිවේදන, අධීක්ෂණ කටයුතු, කෙටි පණිවිඩ
5. මාධ්‍ය සාකච්ඡා, පුවත් නිවේදන, කෙටි පණිවිඩ

08. සන්නිවේදනය හා සම්බන්ධ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - ස්වසංකල්පය

B - ප්‍රදීපාගාර උපක්‍රමය

C - ප්‍රතිරූප ගොඩනැඟීම

D - ප්‍රජාතනය

E - නව මාධ්‍ය

ඉහත ලක්ෂණ අදාළ වන සන්නිවේදන වර්ග පිළිවෙලින් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1. ජන සන්නිවේදනය, මහජන සන්නිවේදනය, සමූහ සන්නිවේදනය, අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය, අතථ්‍ය සන්නිවේදනය
2. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය, සමූහ සන්නිවේදනය, මහජන සන්නිවේදනය, ජන සන්නිවේදනය, අතථ්‍ය සන්නිවේදනය
3. මහජන සන්නිවේදනය, අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය, සමූහ සන්නිවේදනය, ජන සන්නිවේදනය, අතථ්‍ය සන්නිවේදනය
4. අතථ්‍ය සන්නිවේදනය, සමූහ සන්නිවේදනය, අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය, ජන සන්නිවේදනය, මහජන සන්නිවේදනය
5. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය, සමූහ සන්නිවේදනය, ජන සන්නිවේදනය, අතථ්‍ය සන්නිවේදනය, මහජන සන්නිවේදනය

09. ගයාන්ට සිය මිතුරන් සමග සහභාගී වූ විනෝද චාරිකාවක් අතරතුර නිවසින් ලැබුණු දුරකථන ඇමතුම නිසි ලෙස ශ්‍රවණය නොවුණේ බස් රථය තුළ තිබූ අධික ඝෝෂාව නිසා ය. මෙම තත්ත්වය පැහැදිලි කළ හැකි වඩාත් නිවැරදි සන්නිවේදන මූලිකාංගය වන්නේ,

1. සන්නිවේදන බාධක
2. පාරිසරික බාධක
3. මාධ්‍ය බාධක
4. යාන්ත්‍රික බාධක
5. අර්ථ බාධක

10. මාධ්‍ය නියෝජිතයන්ගේ කැපී පෙනෙන මැදිහත්වීමක් සහිත ව නීතිය මගින් ස්ථාපිත කරන ලද නියාමනය

1. ස්වයං නියාමනය ලෙස හැඳින්වේ.
2. සහනියාමනය ලෙස හැඳින්වේ.
3. ව්‍යවස්ථාපිත නියාමනය ලෙස හැඳින්වේ.
4. අභ්‍යන්තර නියාමනය ලෙස හැඳින්වේ.
5. බාහිර නියාමනය ලෙස හැඳින්වේ.

11. සංස්කෘතිය පිළිබඳ ව පිළිගත නොහැකි ප්‍රකාශය කුමක් ද?
    1. සංස්කෘතිය යනු ප්‍රකෘතියේ විකෘතිය යි.
    2. සංස්කෘතිය යනු මිනිසාගේ නිර්මාණයකි.
    3. සංස්කෘතිය වර්ධනයේ දී සීමාවන් ඉක්මවා යයි.
    4. මිනිසා සිය අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා සංස්කෘතිය නිර්මාණය කරගෙන තිබේ.
    5. ජෛව සමාජය හා සංස්කෘතිය අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් දැකිය නොහැකි ය.

12. A - සරල හා නොගැඹුරු ස්වභාවය
    B - සියලු දෙනාට ම සමීප වීම.
    C - කර්මාන්තමය ලක්ෂණ සහිත වීම.
    D - මානවවාදය හා සබුද්ධිකභාවය උත්කර්ෂණයට නැංවීම.
    E - විඥාපන අවධියට අයත් ප්‍රභේදයකි.

මේ අතරින් ජනප්‍රිය සංස්කෘතියේ ලක්ෂණ පමණක් අන්තර්ගත වරණය කුමක් ද?

1. ABE පමණි.
2. BCD පමණි.
3. CDE පමණි.
4. ABC පමණි.
5. ACD පමණි.

13. සාම්ප්‍රදායික සන්නිවේදන මාධ්‍යයක් නොවන්නේ,
    1. සක් හඬ
    2. මාර්ග ආලෝක සංඥා
    3. කොළ අතු එල්ලීම
    4. බෙර හඬ
    5. හූ හඬ

14. ගම්පෙරළිය චිත්‍රපටිය නිර්මාණය කරන ලද්දේ,
    1. මාර්ටින් වික්‍රමසිංහ විසිනි.
    2. ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් විසිනි.
    3. ඩී.බී. නිහාල්සිංහ විසිනි.
    4. ධර්මසේන පතිරාජ විසිනි.
    5. මහාචාර්ය සුනිල් ආරියරත්න විසිනි.


15. මාධ්‍ය, පුද්ගලයාට වැඩි බලපෑමක් එල්ල කිරීමට සමත් වන්නේ,
    1. ස්වකේන්ද්‍රය විඥානික වන විට ය.
    2. ස්වකේන්ද්‍රය අවිඥානික වන විට ය
    3. ඥාන ව්‍යුහ ගොඩනැගෙන විට ය.
    4. කුසලතා දියුණු වන විට ය.
    5. සංජානනය පුළුල් වන විට ය.

16. යුරෝපා කොමිසම ඉදිරිපත් කළ මාධ්‍ය සාකච්ඡාව පිළිබඳ නිර්වචනයේ අන්තර්ගත නොවන කුසලතාවක් වන්නේ,
    1. පරිහරණය
    2. විශ්ලේෂණය
    3. සංස්ලේෂණය
    4. ඇගයුම
    5. නිර්මාණය

17. චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකුට සිය චිත්‍රපටයේ ප්‍රධාන චරිතය ගැමි සමාජයක ජීවත්වන්නෙකු බව පළමු දර්ශනයෙන් ම ප්‍රේක්ෂකයා වෙත හැඟවීමට අවශ්‍ය ව තිබේ. මේ සඳහා ඔහු භාවිත කළ යුතු රූප රාමුව වන්නේ,
    1. සමීප රූපය
    2. මධ්‍යම රූපය
    3. අතිසමීප රූපය
    4. දුර රූපය
    5. මධ්‍යම දුර රූපය

18. පහත ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය කුමක්ද?
    1. ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය 1951 අංක 23 දරන පනතින් බලාත්මක කර ඇත.
    2. 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම පිහිටුවා ඇත.
    3. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය මඟින් ගුවන්විදුලි සහ රූපවාහිනි විකාශන සඳහා සංඛ්‍යාත පද්ධති බෙදා දීම සිදු කරයි.
    4. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම යනු ස්වයං නියාමන ආයතනයකි.
    5. පුවත්පත් මාධ්‍ය නියාමනය සඳහා පිහිටුවා ඇති රාජ්‍ය ආයතනයක් ලෙස ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය හැඳින්වේ.

පහත සඳහන් ආකෘතිය අනුව 19 සිට 22 දක්වා පිළිතුරු සපයන්න.




19. X හා Y ආකෘති දෙකෙහි ම දැකිය හැකි සන්නිවේදන මූලිකාංගයක් නියෝජනය වන අක්ෂරය වන්නේ,
    1. A ය.  2. B ය.  3. C ය.  4. F ය.  5. H ය.

20. X ආකෘතියේ දැකගත නොහැකි නමුත් Y ආකෘතියේ දැකගත හැකි මූලිකාංග ලෙස හඳුනාගත හැක්කේ,
    1. පණිවිඩය හා අර්ථ නිරූපණයයි.
    2. ආකේතකරය හා පණිවිඩයයි.
    3. මාධ්‍ය හා බලපෑමයි.
    4. විකේතකරය හා මාධ්‍යයයි.
    5. පණිවිඩය හා විකේතකරයයි.

21. B හා H අක්ෂර වලින් දක්වා ඇත්තේ,
    1. ආකේතරණය හා විකේතකරණයයි.
    2. පණිවිඩය හා මාධ්‍යයයි.
    3. අර්ථනිරූපණය හා මාධ්‍යයයි.
    4. පණිවිඩය හා බලපෑම යි.
    5. පණිවිඩය හා ග්‍රාහකයා යි.

22. X හා Y ආකෘති නියෝජනය වන සන්නිවේදන ආකෘති දෙක වන්නේ,
    1. ඇරිස්ටෝටල් සහ හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘති ය.
    2. හැරල්ඩ් ඩී. ලැස්වෙල් සහ ෂැනොන් - විවර් ආකෘති ය.
    3. ෂැනොන් - විවර් සහ ශ්‍රාම් - ඔස්ගුඩ් ආකෘති ය.
    4. ශ්‍රාම් - ඔස්ගුඩ් සහ ඇරිස්ටෝටල් ආකෘති ය.
    5. හැරල්ඩ් ඩී. ලැස්වෙල් සහ ශ්‍රාම් - ඔස්ගුඩ් ආකෘති ය.

23. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් සදොස් ප්‍රකාශය තෝරන්න.
    1. රංග කලාව පිළිබඳ අවබෝධය අන්තර් පුද්ගල චින්තනය හා ව්‍යවහාරික කුසලතා පෝෂණය කර ගැනීම පිණිස අවස්ථා උදා කර දෙයි.
    2. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සංදේශ නිර්මාණශීලී ව සකස් කිරීම සඳහා ජනශ්‍රැති හා ජනකලා භාවිත කළ හැකි ය.
    3. මානව ජීවිතය, මිනිස්කමේ මහිමය, ආශ්චර්ය හා අද්භූත බව සංකලනය වූ නිර්මාණාත්මක මාධ්‍යයක් ලෙස ජනශ්‍රැතිය සඳහන් කළ හැකි ය.
    4. වර්තමානයේ ජනමාධ්‍ය සංදේශ යනු මිනිසුන්ගේ මානසික හා සමාජ තත්ත්වය කෙරෙහි බලපාන බලසම්පන්න සාධකයක් නොවේ.
    5. සන්නිවේදන තාක්ෂණය ඔස්සේ වඩාත් නිර්මාණාත්මක ස්වරූපයෙන්, විචිත්‍ර ආකෘතිවලින් විවිධ සංස්කෘතීන්හි අංග හුවමාරු වේ.

24. බ්‍රිතාන්‍ය සමාජ විද්‍යාඥ ග්‍රැහැම් වොලස් ඔහුගේ The Art of Thought නම් කෘතියේ දක්වන නිර්මාණාත්මක චින්තන ක්‍රියාදාමයට අයත් අදියර නිවැරදි ව ඇතුළත් වරණය තෝරන්න.
   1. සකස් කිරීම, පෝෂණය, ප්‍රදීපනය, සත්‍යාපනය
   2. සංවේදනය, සුවිදර්ශනය, සධුගමනය, සම්බන්ධතා
   3. ප්‍රත්‍යක්ෂණය, පරිකල්පනය, සංවේදනය, සංජානනය
   4. සතතාභ්‍යාසය, සංජානනය, ප්‍රස්තුත ගවේෂණය, කුසලතා
   5. තුල්‍යතාව, නිරූපණය, සම්බන්ධතා, දුර්ලභත්වය

25.

| X | Y |
|---|---|
| A – රාජ්‍ය මහජන සම්බන්ධතා | 1. පිලිප් කොට්ලර්ගේ වර්ගීකරණය |
| B – මහජන සම්බන්ධතා නිලධාරියා | 2. සම්මාන පිරිනැමීම. |
| C – සිද්ධි කළමනාකරණය | 3. රාජ්‍ය දෙකක් හෝ කිහිපයක් සමග ඇති කරගන්නා සම්බන්ධතා |
| D – මහජන සම්බන්ධතා විධික්‍රම | 4. අභිප්‍රේරණාත්මක කථනය |

ඉහත වගුවෙහි X හා Y ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,
   1. A4, B1, D3, C2  2. A3, B4, C1, D2  3. A2, B1, C3, D4
   4. A1, B2, C4, D2  5. A4, B2, C3, D1

26. සිද්ධි කළමණාකරණයේ අවස්ථා අතරට අයත් නොවන්නේ,
   1. විමසුම  2. ක්‍රියාව  3. සැලැසුම
   4. කළමනාකරණය  5. පිළියෙල කිරීම.

27. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය කුමක්ද?
   1. එහි 19 වන වගන්තිය සන්නිවේදනයට අදාළ ය.
   2. එය දෙවන ලෝක යුද්ධයේ අත්දැකීම්වල ප්‍රතිඵලයකි.
   3. එය සකස් කරන ලද්දේ ඇමෙරිකානු විද්වතුන් විසිනි.
   4. ලෝකයේ බොහෝ රටවල මූලික අයිතීන් සඳහා වන පදනම් ලියවිල්ලයි.
   5. සමානතාව අහිමි වීම කෙරෙහි මෙහිදී අවධානය යොමු වී ඇත.

28.

| | |
|---|---|
| 1. BBC ආයතනය පිළිබඳ බ්‍රිතාන්‍ය රාජකීය ප්‍රඥප්තිය | A – ජනමාධ්‍ය ආයතන අතර තාක්ෂණික ගැටලු නියාමනය |
| 2. ඇමෙරිකානු සන්නිවේදන පනත | B - මහජන සේවා ගුවන්විදුලි සංකල්පය ස්ථාපිත කිරීම. |
| 3. මැක්බ්‍රයිඩ් වාර්තාව | C – පෙර පාසල් අවධියේ සිට ම මාධ්‍ය පිළිබඳ අවබෝධය ලබා දිය යුතු ය. |
| 4. ගෲන්වල්ඩ් ප්‍රකාශය | D – 1948.12.10 දින පැරිසියේ දී එළි දක්වන ලදී. |
| 5. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය | E – ගෝලීය මාධ්‍ය නිරූපණය වඩාත් සාධාරණීයකරණය කිරීම. |

ඉහත පළමු ප්‍රකාශයන් හා දෙවන ප්‍රකාශයන් අතර නිවැරදි සබඳතාව දක්වා ඇති වරණය කුමක් ද?
   1. 1B, 2A, 3E, 4C, 5D  2. 1E, 2B, 3E, 4D, 5A
   3. 1B, 2D, 3A, 4E, 5C  4. 1A, 2C, 3B, 4D, 5E
   5. 1C, 2A, 3B, 4C, 5D

29. "සංවර්ධනය යනු මිනිසුන්ගේ සංවර්ධනය මිස ද්‍රව්‍යමය සංවර්ධනයක් නොවේ" යනුවෙන් අදහස් දක්වන ලද්දේ,
   1. ඩඩ්ලි සියර්ස් ය.  2. මහත්මා ගාන්ධිතුමා ය.  3. එඩ්ගා ඕවන්ස් ය.
   4. ශ්‍රී නිවාස් මෙල්කොට් ය.  5. සිල්වියෝ වයිස්බෝඩ් ය.

30. ප්‍රාදේශීයකරණය යනුවෙන් හඳුන්වන්නේ,
    1. සංවර්ධනය සඳහා ජනතාව මූලික කරගත් ඒකාබද්ධ මූලෝපායික ප්‍රවේශයකි.
    2. සංවර්ධනය ඒ ඒ රටවලට ගැළපෙන ලෙස ඒ ඒ රටවල ම සිදු කිරීමයි.
    3. තමන්ගේ ම නැගී සිටිය නොහැකි පුද්ගලයන්ට උපකාර කිරීමයි.
    4. නවීන තාක්ෂණය ජනතා සංවර්ධනය වෙනුවෙන් සැලසුම් කිරීමයි.
    5. පුද්ගලයන්ගේ නිපුණතා යහපැවැත්ම උදෙසා ශක්තිමත් කිරීමයි.

31. තොරතුරු දැන ගැනීමේ පනත සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය කුමක්ද?
    1. 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත මඟින් බලාත්මක කර ඇත.
    2. 2017 පෙබරවාරි 2 වනදා සිට ඊට අදාළ ක්‍රියාකාරී යාන්ත්‍රණය ක්‍රියාත්මක විය.
    3. පනතට අදාළව තොරතුරු දැනගැනීමේ කොමිසම පිහිටුවා ඇත.
    4. කොමිසම මඟින් පනතට අදාළ පැමිණිලි විභාග කරනු ලැබේ.
    5. තොරතුරු දැන ගැනීමේ පනත මඟින් පුරවැසියෙකුට රාජ්‍ය ආයතනවල ඕනෑම තොරතුරක් නිත්‍යානුකූල ව ලබාගත හැකි ය.

32. එක්සත් ජාතීන්ගේ සංවිධානය දක්වන පරිදි සංවර්ධනය සඳහා සන්නිවේදන ප්‍රවේශ අතරට අයත් වන්නේ,
    1. නියාමනය සඳහා සන්නිවේදනයයි
    2. ගැටුම් නිරාකරණයයි.
    3. පුද්ගලාන්තර සම්බන්ධතා ශක්තිමත් කිරීමයි.
    4. මාධ්‍ය ගුණාත්මක භාවයයි.
    5. ප්‍රතිසංස්කරණවලට මැදිහත්වීමයි.

33. සමීක්ෂණයකදී දත්ත රැස්කිරීම සඳහා භාවිත කරන විධික්‍රම අතරට අයත් නොවන වරණය තෝරන්න.
    1. ප්‍රශ්නාවලිය  2. විද්‍යුත් තැපෑල  3. සම්මුඛ සාකච්ඡා
    4. අන්තර්ජාලය  5. වාර්තා ලිවීම

34. සංඛ්‍යාත්මක ව පෙන්වා දිය නොහැකි විශේෂ ගුණාංග හා ආවේණික වූ ලක්ෂණ පෙන්නුම් කරන දත්ත හඳුන්වන්නේ,
    1. ප්‍රාථමික දත්ත  2. ද්විතීයික දත්ත  3. ගුණාත්මක දත්ත
    4. ප්‍රමාණාත්මක දත්ත  5. අමු දත්ත

35. තොරතුරක හෝ ප්‍රවෘත්තියක ඇති කරුණුවල සමාන අසමාන කොටස් සංසන්දනය කිරීමේ හැකියාව විචාරශීලී ග්‍රාහකත්වයට අදාල කවර දක්ෂතාවක් ද?
    1. අනුමානය  2. විශ්ලේෂණය  3. සංස්ලේෂණය
    4. කාණ්ඩකරණය  5. ඇගයීම

36. ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය පහත කවර නියාමන වර්ගයකට අයත් දැයි දක්වන්න.
    1. අභ්‍යන්තරික නියාමනය  2. සහනියාමනය
    3. ව්‍යවස්ථාපිත නියාමනය  4. ස්වයං නියාමනය
    5. චිත්‍රපට නියාමනය

37. ඉෂාරාගේ පෞද්ගලික ඡායාරූප හා වීඩියෝ කීපයක් ඇය ව අපහසුතාවයට පත්වන ආකාරයෙන් කිසිවෙකු විසින් අන්තර්ජාලයට මුදාහැර තිබේ. ඇය ඒ පිළිබඳ ව වහා ම පැමිණිලි කළ යුත්තේ කවර ආයතනයකට ද?
    1. ශ්‍රී ලංකා පොලිසියට ය.  2. අධිකරණයට ය.
    3. පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයට ය.  4. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ය.
    5. ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයට ය.

38. උසස් මාධ්‍ය සාක්ෂරතාවක් ඇති කරගැනීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,
   1. මානසික චර්යා පද්ධතිය පාලනය කරගැනීමේ හැකියාව
   2. විවිධ මාධ්‍ය සංදේශ වඩාත් විචක්ෂණශීලී ව උකහා ගැනීමේ පරිචය ලබාගැනීම.
   3. විවිධ මාධ්‍ය සංදේශ ලබා ගැනීමේ කැමැත්ත වැඩි වීම.
   4. විචාරශීලී චින්තනය දියුණු වීම.
   5. මාධ්‍ය අතර තරඟකාරී ස්වභාවයක් ඇති වීම.

39. ඵලදායී සංදේශයක තිබිය යුතු ගුණාංගයක් නොවන්නේ,
   1. සරල බව
   2. ඇලීම
   3. විශේෂත්වය
   4. සංකීර්ණ බව
   5. ව්‍යුහය

40. සහන් අන්තර්ජාලයට ඇතුළු වී, විද්‍යුත් පුවත්පත් කීපයක් කියවා, යූ ටියුබ් නාලිකා කීපයක තිබූ වීඩියෝ කීපයක් ද නැරඹුවේ ය. එම ක්‍රියාවලියට අදාළ ප්‍රවණතාව වන්නේ,
   1. නිර්මහාපරිමාණකරණය
   2. නිර්නියාමනය
   3. කාණ්ඩකරණය
   4. මාධ්‍ය අභිසාරිතාව
   5. අන්තර්ක්‍රියාකාරීත්වය

41. ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කරන ප්‍රවෘත්තියක පක්ෂග්‍රාහී බව අනාවරණය කර ගැනීමේ දී අදාළ නොවන්නේ,
   1. මූලාශ්‍රය තෝරා ගැනීමයි.
   2. සමබර ප්‍රවෘත්ති වාර්තාකරණයයි.
   3. සංදේශය ගොඩනගන දිශානතියයි.
   4. වාර්තාකරු එම සිදුවීම පවසන ආකාරයයි.
   5. සම්මුඛ සාකච්ඡා සඳහා පුද්ගලයන් තෝරා ගන්නා ආකාරයයි.

42. ලියනාඩෝ ඩාවින්චි පෙන්වා දුන් පරිදි නිර්මාණකරණය හා සම්බන්ධ මූලිකාංගයක් නොවන්නේ,
   1. කුතුහලය
   2. නිරූපණය
   3. සහවේදනය
   4. සම්බන්ධතා
   5. කායික මානසික තුල්‍යතාවය

43. කිසියම් ප්‍රස්තුතයක් ඇසුරින් නිර්මාණයක් බිහි කිරීමට අදාළ ව සංඥානික ව හා ක්‍රමානුකූල ව විමර්ශනය කිරීමේ අදියර ග්‍රැහැම් වොලස්ට අනුව,
   1. පෝෂණය යි
   2. සත්‍යාපනය යි
   3. සකස් කිරීම යි
   4. ප්‍රදීපනය යි
   5. ස්මෘතිය යි

44. පහත ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
   1. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය හැදෑරීමෙන් විචාරශීලී ව මාධ්‍ය පරිහරණය කිරීමේ හැකියාව ලැබේ.
   2. කැලණිය විශ්ව විද්‍යාලය මගින් 1973 දී ''ජනසන්නිවේදන අධ්‍යයන අංශය'' ආරම්භ කරන ලදී.
   3. දෙහිවල කණිෂ්ඨ විශ්ව විද්‍යාලය මූලික වීමෙන් 1986 දී 'පුවත්පත් කලාව' නමින් ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කර ඇත.
   4. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය 2006 වසරේ ප්‍රථම වරට 10 ශ්‍රේණියට හඳුන්වා දී ඇත.
   5. ලේක්හවුස් ආයතනය මගින් 1960 දශකයේ වෘත්තිය මාධ්‍යවේදීන් සඳහා පුහුණු පාඨමාලාවක් පවත්වා ඇත.

45. පුළුල් ග්‍රාහක ක්ෂේත්‍රයකට ඇමතීම හා නිවේදනය කිරීම සඳහා මාධ්‍ය භාවිතයට ගැනීම හඳුනාගත හැකි වන්නේ,
   1. මාධ්‍ය ගෝලීයකරණය ලෙසිනි.
   2. පුද්ගල කේන්ද්‍රීයත්වය ලෙසිනි.
   3. මාධ්‍ය අභිසාරිතාව ලෙසිනි.
   4. නිර්මහාපරිමාණකරණය ලෙසිනි.
   5. මහාපරිමාණකරණය ලෙසිනි.

46. ශ්‍රී ලංකාවේ මාධ්‍ය තාක්ෂණික ප්‍රවණතාවලට අදාළ සාවද්‍ය පිළිතුර වන්නේ,
   1. ජාල තාක්ෂණයෙහි සමාජ මාධ්‍ය ඇසුරු කිරීමේ ප්‍රවණතාව වඩාත් කැපී පෙනීමයි.
   2. අන්තර්ජාල වස්තු ප්‍රවණතාව වර්ධනය වීම යි.
   3. වලාකුළු පරිගණක ප්‍රවණතාව වර්ධනය වීම යි.
   4. මාධ්‍ය බෙදා හැරීම වෙනුවට ප්‍රවේශය බවට පත් වීම යි.
   5. බහු මාධ්‍යවලින් ඒක මාධ්‍ය බවට පත් වීම යි.

47. ශ්‍රී ලාංකේය ජන මාධ්‍යයන්හි අන්තර්ගතයට අදාල නව ප්‍රවණතාවක් ලෙස හදුනා ගත හැකි වන්නේ,
   1. විදග්ධ භාෂා භාවිතය යි
   2. විනෝදාස්වාදය කෙරෙහි වැඩි අවධානයක් දැක්වීම යි.
   3. වෙළඳ දැන්වීම් ප්‍රමාණාත්මක ව ඉහළ නොයෑම යි.
   4. ඉදිරිපත් කිරීමේ නව මාදිලි යොදා නොගැනීම යි.
   5. අධ්‍යාපනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම යි.

48. අනාගතයේ දී විශ්වයේ අපේක්ෂිත මාධ්‍ය ප්‍රවණතාවක් නොවන්නේ,
   1. මෝස් සංඥා ක්‍රමය යි.
   2. කෘත්‍රිම බුද්ධිය යි.
   3. අතථ්‍ය යථාර්ථය යි.
   4. නැනෝ තාක්ෂණය යි.
   5. සංවේදක ජාලය යි.

49. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජනයකි.
   1. චින්තනය ගොඩනංවා ගැනීම.
   2. වඩා ක්‍රීව සන්නිවේදනයට ඉඩ සැලසීම.
   3. අන්තර් සම්බන්ධතා වර්ධනය කරගත හැකි වීම.
   4. දැනුම, සම්පත් බෙදා හදා ගත හැකි වීම.
   5. සමාජීය පොදු කාර්යවලදී ඉවහල් වීම.

50. "යහපත් සිතින් යුතුව සදාචාර සම්පන්නභාවය ඇති කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මහජන සම්බන්ධතා" ලෙස හැඳින්විය හැකි යැයි නිර්වචනය කළේ,
   1. එඩ්වර්ඩ් එල් බර්නීස් ය.
   2. වෙබ්ස්ටර් නව කොලිජියෙට් ශබ්ද කෝෂය යි.
   3. චාල්ස් ප්ලැකාඩ් ය.
   4. සෑම් බ්ලැක් ය.
   5. බ්‍රිතාන්‍ය මහජන සම්බන්ධතා පිළිබඳ වරලත් ආයතනය යි.

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சபரகமுவ மாகாணக் கல்வி திணைக்களம்

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය 2024 -
# අවසාන වාර පරීක්ෂණය

| | | |
|---|---|---|
| සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II<br>தொடர்பாடல் மற்றும் ஊடகக்கல்வி<br>Communication & Media Studies II | 29 S II | 13 ශ්‍රේණිය<br>தரம் 13<br>Grade 13 |
| පැය තුනයි<br>03 மணித்தியாலம்<br>Three Hours | | අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි<br>மேலதி வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்<br>Additional Reading Time – 10 minutes |

උපදෙස් - තෝරාගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
එක් ප්‍රශ්නයකට ලකුණු 40 බැගින් හිමි වේ

01. දෛනික ජීවිතයේ බොහෝ කාර්යයන් සඳහා සන්නිවේදනය අත්‍යවශ්‍ය සාධකයකි.

I. අන්තර් පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන හතරක් නම් කරන්න. (ලකුණු 04)

II. මහජන සන්නිවේදනයේ ප්‍රයෝජන දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

III. විධිමත් හා අවිධිමත් සන්නිවේදනය අතර පවතින වෙනස්කම් තුනක් සන්සන්දනාත්මක ව විස්තර කරන්න. (ලකුණු 12)

IV. ඔබ කැමති ජනමාධ්‍යයක් ඇසුරින් සන්නිවේදන මූලිකාංග හතරක් විස්තර කරන්න.(ලකුණු 16)

02. I. රූපණ කුසලතා වර්ධනයට හේතුවන කරුණු හතරක් නම් කරන්න. (ලකුණු 04)

II. ජන සන්නිවේදනයේ පහත සඳහන් ප්‍රයෝජන කෙටියෙන් විස්තර කරන්න.

(අ) ප්‍රජානනය

(ආ) නිෂ්කර්ෂණය (ලකුණු 08)

III. සන්නිවේදනය සතු කාර්යභාරය කරුණු තුනක් ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 12)

IV. ෂැනොන් විවර් ආකෘතියේ විශේෂතා හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 16)

03. I. යුනෙස්කෝ සංවිධානයේ Many Voices One World කෘතියේ සඳහන් ජනමාධ්‍යයට සුවිශේෂ වූ කාර්ය හතර නම් කරන්න. (ලකුණු 04)

II. මුද්‍රිත මාධ්‍යයක් වන සඟරා සතු ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

III. සාම්ප්‍රදායික මාධ්‍යයක් ලෙස ජන කවිය සතු ලක්ෂණ තුනක් උදාහරණ සහිත ව විස්තර කරන්න. (ලකුණු 12)

IV. සන්නිවේදනයේ ස්වභාවයට අයත් කරුණු හතරක් උදාහරණ සහිත ව විස්තර කරන්න. (ලකුණු 16)

04\. I. ලිඛිත සන්නිවේදන කුසලතා වර්ධනයට හේතු වන කරුණු හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

II. ජේම්ස් ගෘනිග් හා ටොඩ් හන්ට් විසින් ඉදිරිපත් කළ මහජන සම්බන්ධතා ආකෘති හතර නම් කර ඉන් එක් ආකෘතියක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

III. සම්භාව්‍ය සංස්කෘතිය තුළ හඳුනාගත හැකි ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 12)

IV. ගෝලීයකරණයේ සමාජීය බලපෑම කරුණු හතරක් ඔස්සේ නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 16)

05\. I. ජන මාධ්‍යයේ විශේෂතා හතරක් නම් කරන්න. (ලකුණු 04)

II. සංවර්ධනය සඳහා සන්නිවේදන සංකල්පයට අයත් පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

(අ) ජනතා කේන්ද්‍රීයතාව

(ආ) ප්‍රාදේශීයකරණය (ලකුණු 08)

III. සාම්ප්‍රදායික මාධ්‍යයේ වැදගත්කම කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

IV. නිර්මාණාත්මක සන්නිවේදනයේ වැදගත්කම පිළිබඳ ව කරුණු හතරක් ඔස්සේ පුවත්පතකට සුදුසු ලිපියක් සකස් කරන්න. (ලකුණු 16)

06\. ජන මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව වර්තමානයේ දැඩි ව දැනෙන බව බොහෝ දෙනාගේ මතය වී ඇත.

I. මාධ්‍ය නියාමනය සඳහා භාවිත කරන මූලික ප්‍රවේශ හතරක් නම් කරන්න. (ලකුණු 04)

II. 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනතට අදාළ මූලික අයිතිවාසිකම් දෙවර්ගය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

III. ශ්‍රී ලංකාවට විශේෂිත ව දක්නට ලැබෙන මාධ්‍ය තාක්ෂණික ප්‍රවණතා දෙකක් විස්තර කරන්න. (ලකුණු 12)

IV. ඔබ කැමති මාධ්‍ය නියාමන ආයතන හතරක කාර්යභාරයන් පැහැදිලි කරන්න. (ලකුණු 16)

07\. විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා තොරතුරු ලබා ගැනීමට සමීක්ෂණ යොදා ගනී.

I. මූලික සමීක්ෂණ වර්ග දෙක නම් කරන්න. (ලකුණු 04)

II. විචාරශීලී ග්‍රාහකයෙකු සතු විය යුතු කුසලතා දෙකක් විස්තර කරන්න. (ලකුණු 08)

III. මාධ්‍ය සන්දේශයක් විශ්ලේෂණය කිරීම සඳහා පහත සඳහන් කරුණු භාවිත කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(අ) අර්ථය (ආ) විකෘතිකරණය (ඇ) පෙළඹවීම.

(ලකුණු 12)

IV. ඔබ කැමති ජනශ්‍රැතිකාංග හතරක් ආයතනයක මහජන සම්බන්ධතා කාර්ය සඳහා යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 16)

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## අ.පො.ස. (උ.පෙළ) 2024

**අවසාන වාර පරීක්ෂණය - 2024** **13 ශ්‍රේණිය**

**පිළිතුරු පත්‍රය**

| ප්‍රශ්න අං. | පිළිතුර | ප්‍රශ්න අං. | පිළිතුර | ප්‍රශ්න අං. | පිළිතුර | ප්‍රශ්න අං. | පිළිතුර | ප්‍රශ්න අං. | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01) | 2 | 11) | 5 | 21) | 4 | 31) | 5 | 41) | 2 |
| 02) | 4 | 12) | 4 | 22) | 5 | 32) | 1 | 42) | 3 |
| 03) | 3 | 13) | 2 | 23) | 4 | 33) | 5 | 43) | 3 |
| 04) | 1 | 14) | 2 | 24) | 1 | 34) | 3 | 44) | 3 |
| 05) | 4 | 15) | 2 | 25) | 2 | 35) | 4 | 45) | 5 |
| 06) | 2 | 16) | 3 | 26) | 4 | 36) | 3 | 46) | 5 |
| 07) | 5 | 17) | 4 | 27) | 3 | 37) | 3 | 47) | 2 |
| 08) | 2 | 18) | 3 | 28) | 1 | 38) | 5 | 48) | 1 |
| 09) | 3 | 19) | 1 | 29) | 3 | 39) | 4 | 49) | 1 |
| 10) | 2 | 20) | 3 | 30) | 2 | 40) | 4 | 50) | 3 |

## 2024 අ.පො.ස. උසස්පෙළ පිළිතුරු පත්‍රය

## සන්නිවේදනය මාධ්‍ය අධ්‍යයනය

**13 ශ්‍රේණිය** **II පත්‍රය**

01. I.
- වඩාත් පහසුවෙන් අන්තර් ක්‍රියාකාරී සන්නිවේදනයක යෙදවීමට ඇති හැකියාව.
- අනෙකුත් සන්නිවේදන වර්ගයන්ට සාපේක්ෂව පෙළඹවීමේ හැකියාව වැඩිවීම.
- අන්තර් සම්බන්ධතාව වර්ධනය කර ගැනීමට හැකි වීම.
- පහසුවෙන් අන්‍යෝන්‍ය අවබෝධය හා විශ්වාසය තහවුරු කරගත හැකිවීම.
- වඩා තීව්‍ර සංවේදනයකට අවකාශ සැලසීම.

(ලකුණු 04)

II.
- කිසියම් අරමුණක් සඳහා ජන සමූහයක් පොළඹවා ගැනීමට හැකිවීම.
- ප්‍රස්තුත කරුණු පිළිබඳව වැඩිදුර දැනුවත් කිරීමක් සිදු කිරීමට යොදා ගත හැකි වීම.
- ප්‍රතිරූප ගොඩ නංවා ගැනීමට උපකාර වීම.
- කිසියම් මතයක් නිර්මාණය කිරීමට හේතු වීම.
- විවිධ පාර්ශවවල අවධානය දිනා ගැනීමට හැකි වීම.

(ලකුණු 4×2=08)

III.

| විධිමත් සන්නිවේදනය | අවිධිමත් සන්නිවේදනය |
|---|---|
| • මූලාශ්‍රය පැහැදිලි වීම. | • මූලාශ්‍රය පැහැදිලි නොවීම. |
| • තොරතුරු ගලා යාම වේගවත් බව අඩුවීම. | • තොරතුරු ගලා යාම වේගවත් බව වැඩිවීම. |
| • වගකිව යුත්තෙක් සිටී. | • වගකිව යුත්තෙක් නොසිටී. |
| • නිශ්චිත ධූරාවලියක් සහිතය. | • නිශ්චිත ධූරාවලියක් නොමැත. |
| • න්‍යාය පත්‍රයකට අනුව ක්‍රියාත්මක වේ. | • නිශ්චිත න්‍යායපත්‍රයක් නොමැත. |
| • නිශ්චිත ස්ථානයක් කාලයක් පැවතීම. | • නිශ්චිත ස්ථානයක්, කාලයක් නොමැත. |

(ලකුණු 12)

IV. සන්නිවේදකයා, ආකේතකරණය, සංදේශය, නාලිය, මාධ්‍ය, ග්‍රාහකයා, විකේතකරණය, ප්‍රතිපෝෂණය, අත්දැකීම් පසුතලය, සන්දර්භය, බලපෑම ආදී මූලිකාංග ඇසුරින් ජනමාධ්‍යක් දක්වා පැහැදිලි කර තිබිය යුතුය. (ලකුණු 4×4 =16)

02. I. රූපණ අවස්ථා නිරීක්ෂණය
අනුකරණය
විවිධ සන්නිවේදන අවස්ථා රූපණයෙන් ඉදිරිපත් කිරීම.
විවිධ අවස්ථා අනුව රූපණය වෙනස් වන ආකාරය අවබෝධ කර ගැනීම.

II. ප්‍රජානනය :- දැනුම ලබා ගැනීම පිළිබඳ ප්‍රමාණාත්මක විස්තරයක් තිබිය යුතුය.
නිෂ්කර්ෂණය :- පුද්ගලයන්ගෙන් හා කාර්යයන්ගෙන් ඉවත් වීම පිළිබඳ ප්‍රමාණාත්මක විස්තරයක් තිබිය යුතුය.

III. තොරතුරු සම්පාදනය
අධ්‍යාපනය / උපදෙස් සම්පාදනය
පෙළඹවීම
විනෝදාස්වාදය

IV.
- රේඛීය ආකෘතියක් වීම.
- සන්නිවේදනයට බලපාන බාධක තත්වයන් පිළිබඳව මුල් වරට අදහස් ඉදිරිපත් කිරීම.
- ප්‍රතිපෝෂණය පිළිබඳව අවධානය යොමු නොකිරීම.
- සම්ප්‍රේෂණ හා ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය විග්‍රහ කිරීම.

- තාක්ෂණික දෘෂ්ටිකෝණයකින් සන්නිවේදන ක්‍රියාවලිය විග්‍රහ කිරීම / විමසා බැලීම.

03. I. සුපරීක්ෂණය, අර්ථකථනය, සහසම්බන්ධය, සමාජානුයෝජනය (ලකුණු 04)

II.
- නිශ්චිත තේමාවක් ඔස්සේ ප්‍රකාශයට පත් කිරීම.
  (කලා/ ක්‍රීඩා/ ආගමික/ දේශපාලනික/ ආර්ථික)
- පළවන සංදේශ යම් කාලයක් සුරක්ෂිතව තබා ගනිමින් දැනුම ලබා ගත හැකි වීම.
- බොහෝ විට දෛනික තොරතුරු අන්තර්ගත නොවීම.
- ආකර්ශනීය, නිර්මාණශීලී නිමාවකින් යුතු වීම.
  (මුද්‍රණයේ ගුණාත්මක බව / භාෂා භාවිතය / ඡායාරූප භාවිතය)

(ලකුණු 4×2 =8)

III.
- මුඛ පරම්පරාගතව පැවතීම.
- සරල බස් වහරක් භාවිත කිරීම.
- නිර්මාණකරුවා කවරෙක්දැයි හඳුනාගත නොහැකි වීම.
- ඒ ඒ ප්‍රදේශවලට ආවේණික ලක්ෂණ වලින් සමන්විත වීම.
- දීර්ඝ කාලයක් මුළුල්ලේ මිනිසුන් අතර ජනශ්‍රැතියක් ලෙස පැවතීම.
- ජීවන අත්දැකීම් පාදක වීම.

(ලකුණු 3×4 =12)

IV.
- සන්නිවේදනය අරමුණු සහගතය.
- සන්නිවේදනය සංකේතාත්මකය.
- සන්නිවේදනය සන්දර්භානුගතය.
- සන්නිවේදනය ක්‍රියාපටිපාටියකි.
- සන්නිවේදනය විවිධාකාර වේ.
- සන්නිවේදනය ඒක මාර්ගික මෙන්ම ද්විමාර්ගික වේ.
- සන්නිවේදනය බලය වේ.

(ලකුණු 4×4 =16)

04. I. ලිවීමේ කුසලතා හඳුනා ගැනීම.
සාක්ෂරතාව
පොත පත කියවීම.
නිරවුල්ව පැහැදිලිව සංවිධානාත්මකව ලිපි ලේඛන ලිවීම.
නිර්මාණශීලී භාවය වර්ධනය කර ගැනීම. (ලකුණු 04)

II. පුවත් නියෝජිත / ප්‍රචාරණ ආකෘතිය
මහජන තොරතුරු ආකෘතිය
ද්විමාර්ගික අසම්මතික ආකෘතිය
ද්විමාර්ගික සමමිතික ආකෘතිය

(නම් කිරීම = 4)
(විස්තරය = 4)

III.
- බුද්ධි මට්ටමෙන් හා රසඥතාවයෙන් උසස් වීම.
- දෛනික ශ්‍රම ක්‍රියාකාරීත්වය සමඟ ඍජුව සම්බන්ධ නොවීම.
- ප්‍රභූ පැලැන්තියට සීමා වීම.
- සුවිශේෂී පුද්ගල නිර්මාණයක් වීම.
- සාදාචාරාත්මක මට්ටම උසස් වීම.
- නිර්මාණවල හිඟයක් දක්නට ලැබීම. (ලකුණු 6×2 =12)

IV.
- නව සංස්කෘතික රටාවක් නිර්මාණය වීම.
- අන්තර්ජාතික න්‍යාය පත්‍රයකට අනුව රටවල් හැසිරවීම.
- සමාජ ක්‍රියාකාරකම් මාධ්‍ය මූලිකව සිදු වීම.
- නව තොරතුරු අවකාශ පුළුල් වීම.
- ජාතික රාජ්‍යයන්වල පවතින අනන්‍යතා අභියෝගයට ලක් වීම.
- පාරිභෝගික සංස්කෘතියක් ඇති කිරීම.
- බහු භාණ්ඩකරණයට ලක් වීම.

- මාධ්‍ය තාක්ෂණික භාවිතය ප්‍රබල වීම. (ලකුණු 4×4 =16)

05\. I. තාක්ෂණික මෙවලම් භාවිතය
ක්ෂණික හා අඛණ්ඩත්වයකින් යුක්ත වීම.
සංවිධානගත ආයතනික ව්‍යුහයකින් සමන්විත වීම.
වෘත්තීය සන්නිවේදකයෝ සිටිති.
බහු විධ දොරටුපාලන ක්‍රියාවලියකට යටත් ය.
බහු විධ ග්‍රාහකත්වයකින් යුක්තිය.
ප්‍රමාදිත ප්‍රතිපෝෂණයක් දක්නට ලැබේ.
බොහෝ විට වාණිජත්වය පදනම් කරගනී. (ලකුණු 4)

II. ජනතා කේන්ද්‍රියතාව - පුරවැසියෙකුට තම සියලු අවශ්‍යතා වෙනුවෙන් අදහස් දැක්වීමට ලැබෙන අවස්ථාවකි.
ප්‍රාදේශීයකරණය - සංවර්ධනය ඒ ඒ රටවලට ගැළපෙන ලෙස ඒ ඒ රටවලට කර ගැනීම.
ප්‍රමාණවත් ලෙස විස්තර සපයා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ලකුණු 4×2 =8)

III. දැනුම් ඉගෙනුම් සම්පාදනය
උපදේශාත්මක සංදේශ ජනනය කළ හැකි වීම.
සංස්කෘතික අංග හුවමාරු කිරීමට හැකවීම.
භාව ප්‍රකාශනය
අහිතකර සමාජ ප්‍රවණතා විවේචනයට ලක් වීම.
විනෝදාස්වාදය සඳහා යොදා ගත හැකිවීම

IV.
- දෛනික ජීවිතය හා වෘත්තීය ජීවිතය ශක්තිමත් කර ගැනීම හා ප්‍රබෝධවත් කර ගැනීමට.
- සවිමත් ඇවතුම් පැවතුම් සහිත අක්‍රිය පුරවැසියා නව පුරවැසියෙකු ලෙස සක්‍රීය කිරීමේ හැකියාව.
- සංකීර්ණ හා අවිවේකි වත්මන් මානව ස්වභාවය ජයගත හැකි වීම.
- ග්‍රාහකයා ආකර්ෂණය කරගනිමින් ප්‍රබල ලෙස සංදේශ ඉදිරිපත් කළ හැකි වීම.
- ගැඹුරු සංකල්ප හා දර්ශනවාද පහසුවෙන් අවබෝධ කර ගැනීමට.
- විවිධ විකල්ප දැනුම පරාස හඳුනාගෙන ජීවිතයේ මධ්‍යස්ථභාවය හඳුනා ගැනීමට.
- සතුට, සැහැල්ලුව, අධ්‍යාත්මික ප්‍රබෝධය, චිකිත්සාව වැනි මානව උවමනා ඉටු කර ගැනීම සහ පෝෂණය කර ගැනීම සඳහා

06\. I. ස්වයං නියාමනය
සහනියාමනය
ව්‍යවස්ථාපිත නියාමනය
අභ්‍යන්තරික නියාමනය (ලකුණු 4)

II. ආර්ථික අයිතිවාසිකම්
සාධාරණ භාවිතය යන කරුණු ඔස්සේ විස්තර කර තිබිය යුතුය. (ලකුණු 4×2 =8)

III.
- පැරණි මාධ්‍ය, නව මාධ්‍ය බවට පත් වෙමින් තබීම.
- සමාජ මාධ්‍ය ඇසුරු කිරීමේ ප්‍රවණතාව වඩාත් කැපී පෙනීම.
- අන්තර්ජාල වස්තු ප්‍රවණතාව
- වළාකුළු පරිගණක තාක්ෂණික ප්‍රවණතාව
- ජන මාධ්‍යවලින් බහු මාධ්‍ය වලට පැමිණීම.
- අතථ්‍ය යථාර්ථය
- කෘතිම බුද්ධිය
- අධිවේගී පුළුල් කලාප ජාල (ලකුණු 6×2 =12)

IV.
- ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය
- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිශන් සභාව

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

- ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
- ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය.

යන ආයතනවල කාර්යභාරය ප්‍රමාණවත් ලෙස විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ලකුණු 4×4 =16)

07. I. විස්තරාත්මක සමීක්ෂණ
විග්‍රහාත්මක සමීක්ෂණ (ලකුණු 4)

II. විශ්ලේෂණය
ඇගයීම
කාණ්ඩකරණය
අනුමානය
නිගමනය
සංශ්ලේෂණය
ව්‍යුක්තිකරණය (ලකුණු 4×2 =8)

III. අර්ථය - ඍජු ප්‍රකාශිත නොවන යමක් පිළිබඳ පැහැදිලිව සන්නිවේදනය කිරීමයි.
පෙළඹවීම- මාධ්‍ය මඟින් පුද්ගල විශ්වාස, ආකල්ප, අභිප්‍රාය හෝ හැසිරීම කෙරෙහි බලපෑම් ඇති කර පිළිගැනීමට යටත් කිරීමයි.
විකෘතිකරණය - විවිධ ආකාරයේ මැදිහත්වීම්වලින් සංදේශ විකෘති කිරීම් වලට ලක්වීම.
ඉහත කරුණු ගැළපෙන පරිදි විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.
(ලකුණු 4×3 =12)

IV. ජනකවි, ජනකතා, ජනනාටක, ශාන්තිකර්ම හා යාතුකර්ම ආදි ජනශ්‍රැතිකාංග ඇසුරින් ආයතනයක මහජන සම්බන්ධතා කාර්ය සිදු කරන ආකාරය පැහැදිලිව දක්වා ඇත්නම් සම්පූර්ණ ලකුණු ප්‍රධානය කරන්න. (ලකුණු 4×4 =16)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න